# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2017

## පළමු සෙමෙස්තර අවසානය

## ECN 2125/ENH 2110 – ග්‍රාමීය සංවර්ධනය හා කෘෂි අලවිකරණය

කාලය : පැය (02) දෙකයි.

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම සමානව ලකුණු ලැබේ.

---

01.

i. කෘෂිකර්මාන්තයෙහි ප්‍රධාන කොටස් නිදර්ශන දක්වමින් විභාග කරන්න.

ii. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන දුර්වලතා මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ වැවිලි අංශය මුහුණපාන ප්‍රධාන ගැටලු මොනවාද?

02.

i. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයෙහි ප්‍රධාන පාරිසරික ගැටලු මොනවාද?

ii. එම පාරිසරික ගැටලු උදෙසා දායක වන සාධක මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාරිසරික ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ඔබ කරන්නා වූ යෝජනා මොනවාද?

03.

i. කෘෂිකාර්මික විප්ලවයන්හි ප්‍රධාන ආර්ථික බලපෑම් මොනවාද?

ii. හරිත විප්ලවයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය උදෙසා හරිත විප්ලවය කොතෙක් දුරට බලපානු ලැබුවේද?

04.

i. ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතර කෘෂිකර්මය සඳහා ආකර්ෂණයක් පවතීද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ii. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය නවීකරණය උදෙසා ඔබ යෝජනා කරන්නේ මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාපෘති සේවා වල පවතින ප්‍රධාන දුර්වලතා මොනවාද?

05.

i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි මූලික ග්‍රාමීය කර්මාන්ත මොනවාද?

ii. මෙම කර්මාන්ත වල ප්‍රධාන දුර්වලතා මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ කෘෂි මූලික ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ඔබගේ යෝජනා මොනවාද?

06.

i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි කර්මාන්තය ආශ්‍රිත අලවිකරණ ගැටලු මොනවාද?

ii. මෙම ගැටලු කොතරම් දුරට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය අඩාල කිරීම උදෙසා බලපානු ලැබේද?

iii. ශ්‍රී ලංකාවේ කෘෂි අලවිකරණ ගැටලු වැළැක්වීම සඳහා ඔබගේ යෝජනා මොනවාද?

07.

i. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන ග්‍රාමීය සංවර්ධන උපක්‍රම මොනවාද?

ii. මෙම උපක්‍රම කොතරම් දුරට අපේක්ෂිත අරමුණු සපුරා ගනු ලැබේද?

iii. ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික කේන්ද්‍රීය සංවර්ධන උපක්‍රමයන්හි ආවස්ථික පිරිවැය මොනවාද?

08.

i. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය තුළ ශ්‍රම හිඟය සඳහා දායකවන්නා වූ ප්‍රධාන සාධක මොනවාද?

ii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ ශ්‍රම හිඟය තුළින් ඇතිවන්නා වූ ආර්ථික බලපෑම් මොනවාද?

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ පවතින ශ්‍රම හිඟය වැළැක්වීම සඳහා ඔබගේ යෝජනා මොනවාද?

09. පහත ප්‍රකාශයන්හි ආර්ථික බලපෑම් කෙටියෙන් විභාග කරන්න.

i. "ශ්‍රී ලංකාවේ පවතින ග්‍රාමීය මූලික මානව ජනාවාසකරණය."

ii. "විවිධ අරමුණු උදෙසා ශ්‍රී ලංකාවේ තෙත් කලාපය වුවමනාවට වඩා භාවිත කරයි."

iii. "ශ්‍රී ලංකාවේ අකාර්යක්‍ෂම ආහාර නිෂ්පාදනයේ පිරිවැය එහි පාරිභෝගිකයන් මත පතිත වෙයි."

10). ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පහත දැක්වෙන මාතෘකා අතරින් <u>(03)</u> <u>තුනක්</u> පිළිබඳව සවිස්තරාත්මක සටහනක් ලියන්න.

| | |
|---|---|
| i. පොහොර සහනාධාරය | ii. ග්‍රාමීය කර්මාන්ත |
| iii. කෘෂි අධ්‍යාපනය | iv. ජල දූෂණය |
| v. වැවුප් භාණ්ඩ | vi. ආහාර සංරක්ෂණය |

***********